රුහුණ විශ්වවිද්‍යාලය
පුරප්පාඩු

<u>ආරක්ෂක නියාමක (පහළ ශ්‍රේණිය) තනතුර - (කොන්ත්‍රාත් පදනම මත)</u>

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින ආරක්ෂක නියාමක (පහළ ශ්‍රේණිය) තනතුර සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක UGC/HR/2/3/2(II) සහ 2019.06.11 දිනැති ලිපියට අනුව වසරක කොන්ත්‍රාත් පදනම මත ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක වල ස්ථිර පදිංචි ත්‍රිවිධ හමුදා හා පොලිසියේ සේවයෙන් විශ්‍රාම ලබා ඇති නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ අනුව විශ්වවිද්‍යාලය මඟින් සපයා ඇති අයදුම් පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අවශ්‍ය වන අතර අයදුම්කරුගේ ලිපිනය ලියන ලද මුද්දර ගැසූ සෙ.මී. 22×10 ප්‍රමාණයේ ලියුම් කවරයක් මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන) වෙත එවීමෙන් හෝ රුහුණ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියට පිවිසීමෙන් (www.ruh.ac.lk) හෝ ආයතන අනධ්‍යයන අංශය වෙත පැමිණ මෙම අයදුම් පත්‍ර ලබාගත හැකිය.

2019.07.08 දින තෙක් මෙම අයදුම්පත් නිකුත් කරනු ලබන අතර නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඔබගේ අයදුම්පත් ඔබ පදිංචි කොට්ටාශයේ ග්‍රාමනිලධාරී වෙතින් මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකයක්ද සමඟ 2019.07.08 දින හෝ දිනට ප්‍රථම **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන), රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

අසම්පූර්ණ හෝ අපැහැදිලි හෝ ඉහත සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සපුරා නොතිබීම හෝ නියමිත දිනට පෙර එවීමට අපොහොසත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් කවර හේතුවක් නිසා හෝ නැවත සලකා බැලීමට අවකාශ නොමැති බව සැලකිය යුතුය.

මූලික සුදුසුකම්:

i. අට වැනි ශ්‍රේණිය සමත් වීම.
ii. ක්‍රීඩා, සාමාජීය කටයුතුවල ක්‍රියාකාරී ලෙස සහභාගී වූවන් විය යුතුය.
iii. උස අඩි 05 අඟල් 04 ට නොඅඩු විය යුතුය.
iv. පපුව අඟල් 32 ට නොඅඩු විය යුතුය.
v. තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට පෙර ඔබ විසින් ඉහත සඳහන් "iii" සහ "iv" ඇතුළු වෛද්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරීවරයා පවත්වනු ලබන පරීක්ෂාවට ඔබ ඉදිරිපත් විය යුතුය.

මාසික දීමනාව : රු. 32,250.00 ක මාසික දීමනාවක් හිමි වේ.

බඳවා ගැනීම : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

පී. එස්. කලුගම
ලේඛකාධිකාරී
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.

ලේඛකාධිකාරී

රුහුණ විශ්වවිද්‍යාලය,
වැල්ලමඩම,
මාතර.
2019.06.18